# *නිල් කකුළු පුවත් හසුන් පත අංක* 10

ශ්‍රී ලංකා නිල් පිහිනුම් කකුළු සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කලේ ජාතික ධීවර කර්මාන්ත ආයතනයේ කකුළුවන් පිලිබඳ කෞන්සිලය සහ ධීවර අමාත්‍යාංශය විසින් 2013 වසරේ නොවැම්බර් මාසයේදීය.

ශ්‍රී ලංකා නිල් පිහිනුම් කකුළු සංවර්ධන ව්‍යාපෘතිය තුන් හවුල් ව්‍යාපෘතියක් වන අතර, එය හරහා ධීවරයින්, නිෂ්පාදකයින්, සහ පරිපාලයකන් එකතු වී මෙම මත්ස්‍ය කර්මාන්තයේ පාරිසරික සහ ජීව විද්‍යාත්මක තත්වයන් වැඩි දියුණු කිරීමට දරන උත්සහයකි. අපගේ ප්‍රධාන පරමාර්ථය වන්නේ පෝක් සමුද්‍ර සංධියේ සහ මන්නාරම් බොක්කේ පිහිටා ඇති මෙම මත්ස්‍ය කර්මාන්තය තිරසාර ලෙස අදටත් හෙටටත් පවත්වාගෙන යාමයි.

පස් වසරකට පසුව, ආරම්භයේ සිටම තිබූ අපගේ ප්‍රධාන අරමුණක් සපුරා ගැනීමට හැකි විය. 2018 දෙසැම්බර් මාසයේ 19වනදා, මොන්ටරෙයි බේ සංවිධානයේ සීෆුඩ් වොච් වැඩසටහන මගින්, පෝක් සමුද්‍ර සන්ධියේ සහ මන්නාරම් බොක්කේ පිහිටි නිල් කකුළු මත්ස්‍ය කර්මාන්ත දෙකෙන්ම ආනයනය වෙන නිෂ්පාදනයන් 'හොඳ විකල්ප' වශයෙන් නිර්දේශ කරන ලදී.





| | | |
|---|---|---|
| රට | ශ්‍රී ලංකාව | |
| කලාපය | නැගෙනහිර ඉන්දියන් සාගරය | |
| ධීවර ආම්පන්න | කකුළු දැල්/පැටලෙන දැල් | |
| ධීවර කර්මාන්තය | පෝක් සමුද්‍ර සන්ධිය | මන්නාරම් බොක්ක |
| සීෆුඩ් වොච් නිර්දේශය | හොඳ විකල්පයක් | හොඳ විකල්පයක් |
| සීෆුඩ් වොච් ලකුණු | 2.337 | 2.208 |

© 2018, Monterey Bay Aquarium Foundation

පෝක් සමුද්‍ර සන්ධියේ සහ මන්නාරම් බොක්කේ පිහිටි නිල් කකුළු ධීවර කර්මාන්තයන් දෙක ශ්‍රී ලංකාවේ පමනක් නොව ආසියාවෙත් මෙම නිර්දේශය ලබාගත් පළමු ධීවර කර්මාන්ත දෙක වෙයි.

මොන්ටරෙයි බේ සංවිධානයේ සීෆුඩ් වොච් වැඩසටහනේ නිර්දේශ වාර්තාවන් ඔවුන්ගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. (https://www.seafoodwatch.org/seafood-recommendations).



Monterey Bay Aquarium
Seafood Watch

Blue swimming crab

*Portunus pelagicus*

©R. Swainston/www.anima.net.au

Sri Lanka

Set gillnets

*December 19, 2018*

*Seafood Watch Consulting Researcher*

Disclaimer
Seafood Watch® strives to have all Seafood Reports reviewed for accuracy and completeness by external scientists with expertise in ecology, fisheries science and aquaculture. Scientific review, however, does not constitute an endorsement of the Seafood Watch program or its recommendations on the part of the reviewing scientists. Seafood Watch is solely responsible for the conclusions reached in this report.

Seafood Watch Standard used in this assessment: Standard for Fisheries vF3




| Seafood Watch Recommendation 2018 | South and South East Asian Blue Swimming Crab Fisheries | | | | | |
|---|---|---|---|---|---|---|
| GOOD ALTERNATIVE | Sri Lanka | | | | | |
| AVOID | China | India | Indonesia | Philippines | Thailand | Vietnam |

## සීෆුඩ් වොච් සම්මතයන් #1- *ධීවර කර්මාන්තය ඉලක්ක කරනා සත්ව විශෙෂයන්ට ඇති බලපෑම්*

| | පෝක් සමුද්‍ර සන්ධිය | මන්නාරම් ද්‍රෝණිය |
|---|---|---|
| ඉලක්ක කරනා විශෙෂයට ඇති බලපෑම් | 3.318 | 2.644 |

2015 සිට සෑම වසරකම කකුලුවන්ගේ දිග ප්‍රමාණය මගින් අභිජනන හැකියාව (LBSP) හරහා, කකුළු තොගයේ තක්සේරුවක් කරනා ලදී. මෙම ක්‍රමවේදය හඳුන්වාදෙනු ලැබුවේ ආචාර්ය ජෙරම් ප්‍රින්ස් සහ ආචාර්ය ඒඩ්‍රියන් හෝර්ඩික් විසින් වන අතර ඔබටත් එම මෘදුකාංගය මෙම වෙබ් අඩවියෙන් ලබාගත හැක.



මෙම ක්‍රියාවලිය සඳහා, කකුළුවෝ 34,000කට වඩා ප්‍රමාණයකින් මිණුම් ගත් අතර මේ සඳහා ධීවර ජනතාවගෙන් සහ නිෂ්පාදකයන්ගෙන් අනගි සහයක් ලැබුනි. මෙමෙ ක්‍රියාවලිය අධීක්ශනය කිරීමට ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යංශයේ දිස්ත්‍රි නිලධාරින් සහභාගී විය.

මෙම LBSP අධ්‍යනයට අනුව පෝක් සමුද්‍ර සන්ධියේ සහ මන්නාරම් ද්‍රෝණියේ නිල් පිහිනුම් කකුළු තොගයන් තිරසාර මට්ටමක (>30%) පවතින බවට අනාවරණය විය.


| නිල් කකුළු ධීවර කර්මාන්තයන් | TRP | 2014/15 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| පෝක් සමුද්‍ර සන්ධිය | 30% | 32% | 44% | 47% | 45% |
| මන්නාරම් ද්‍රෝණිය | | 31% | 46% | 41% | 37% |

*සීෆුඩ් වොච් සම්මතයන් #2 - ධීවර කර්මාන්තය ඉලක්ක නොකරනා සත්ව විශේෂයන්ට ඇති බලපෑම්.*

| | පෝක් සමුද්‍ර සන්ධිය | මන්නාරම් ද්‍රෝණිය |
|---|---|---|
| වෙනත් විශේෂයන්ට ලැබුනු ලකුණු ඇගයීම | 1.00 | 1.00 |

පසු ගිය වසර 5 තුල ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ සහ සාභර විශ්වවිද්‍යාලයේ සිසුන් කිහිම දෙනෙකුම තම අවසන් වසරේ පර්යේෂනයන්ට නිල් පිහිනුම් කකුළු ධීවර කර්මාන්තයෙන් අනික් විශේෂයන්ට සිදුවන පාරිසරික බලපෑම අධ්‍යනය කරන ලදී.

මෙම අධ්‍යනයන්ගෙන් අනාවරණය වූයේ කකුළුවන් ඇල්ලීමට උපයෝග කරගන්නා දැල් වලට වෙනත් සත්ව විශේෂයන් 150ක් හසු වන බවයි. දැල් වලට හසු වෙන විශේෂයන්ගේ සමස්ත බර අතින් ගත් කල, පෝක් සමුද්‍ර සන්ධියේ 30% වෙනත් විශේෂ වූ අතර, එය මන්නාරම් ද්‍රෝණියේ 55% විය. මෙයින් 15% සහ 47%, පෝක් සමුධ්‍ර සංධියේ සහ මන්නාරම් ද්‍රෝණියේ යම් ප්‍රයෝජනයකට ගන්නා ලදී. ධීවර කර්මාන්ත දෙකේම සම්පූර්ණ පලයෙන් 15%කට වඩා අඩුවෙන් අහක දමන ලදී.



විශේෂයන් බහුතරයක් අසු වූයේ ඉතා අඩු ප්‍රමාණයගෙනි. පෝක් සමුද්‍ර සන්ධියේ වැඩියෙන්ම අසු වුනේ දැල්ලන් (3.89%), චොකොලට්-පැහැති මුහුදු තරු (3.4%), සහ ආප්ප මඩුවන් (2.9%) විය. මන්නාරම් ද්‍රෝනියේ මෙසේ වැඩිපුරම අසු වූයේ නිල්-පැහැති මඩුව (15.8%), ආප්ප මඩුව (15.3%), සහ සන්ගු (9.0%) විය.
මන්නාරම් ද්‍රෝණියේ කකුළු සහ මඩු ධීවරයින් හිඩැස් විශාල දැල් භාවිතා කරන අතර මෙම දැල් වලට කැස්බෑවන්, ඩොල්ෆින් සතුන් හෝ මුහුදු ඌරන් හසු නොවන බවට අනාවරණය විය.

*සීඵුඩ් වොච් සම්මතයන් #3 - ධීවර කර්මාන්තයේ පරිපාලනය සහ රෙගුලාසි හඳුන්වාදීම*

| | පෝක් සමුද්‍ර සන්ධිය | මන්නාරම් ද්‍රෝණිය |
|---|---|---|
| **පරිපාලනයට ලැබුනු ලකුණු ඇගයීම** | **3.00** | **3.00** |

උතුරේ යුද්ධය 2009 අවසන් වුනාට පසුව 2016 දක්වා, මෙම ධීවර කර්මාන්තයේ පරිපාලනය වුයේ මුහුදු ආහාරයන්ට විදේශ වෙළඳපොලෙන් මධ්‍යම ප්‍රමාණයේ (150g) සහ විශාල ප්‍රමාණයේ (>200g) තිබූ ඉල්ලුමෙන් සහ ධීවරයන්ගේ විසින් $4^{1/2}$" හිඩැස් දැල් භාවිතයෙනි.

2017 වර්ෂයේදි නිල් පිහිනුම් කකුළු සංවර්ධන ව්‍යාපෘතිය විසින් මෙම ධීවර කර්මාන්තයට භාවිත සංග්‍රහයක් ඉදිරිපත් කරන ලදී. 2018 වර්ෂයේදි නිල් පිහිනුම් කකුළුවන් හසු කරගැනීම, මිලදී ගැනීම, නිෂ්පාදනය, සහ අපනයන කිරීම පිලිබඳ නීති රෙගුලාසි හඳුන්වාදෙනු ලැබුනි. සියලු දෙනා මෙම රෙගුලාසි වලට එකඟ වූවාට පසුව, 2019 වර්ෂයේදි මෙය චක්‍රලේඛයක් ලෙස නීතිගත විය.





මෙම ධීවර කර්මාන්තයේ කළමනාකරණය තවත් ශක්තිමත් කිරීමට නව ධීවර කලමනාකරණ කලාපයන් දෙකක් යෝජනා කරන ලදී (දකුණු පැත්තේ පිහිටි සිතියම). මෙම කලාපයන් තුල සිටින ධීවර අධීක්ෂකවරුන් යටතේ වෙනම කළමනාකරණ කමිටු පිහිටුවීම දැනටමත් ආරම්භ කර ඇත.

පෝක් සමුද්‍ර සන්ධියේ සහ මන්නාරම් ද්‍රෝණියේ කකුළු කර්මාන්තයන් සඳහා කළමනාකරණ වාර්තාවන් 2018 වසරේදී ක්‍රියාවට නන්වන ලදී.

## *සීෆුඞ් වොච් සම්මතයන් **#4** - වාසභූමි සහ පරිසර පද්ධති වලට අදාල ලකුණු*

| | පෝක් සමුද්‍ර සන්ධිය | මන්නාරම් ද්‍රෝණිය |
|---|---|---|
| **වාසභූමි සහ පරිසර පද්ධති වලට අදාල ලකුණු ඇගයීම** | **3.00** | **3.00** |




නිවර්තන කලාපයක පිහිටි දූපතක් වන නිසාවෙන් ශ්‍රී ලංකාවේ විවිධාකාර පරිසර පද්ධති පිහිටා ඇත. ශ්‍රී ලංකා මුහුදේ පිහිටි ප්‍රධාන පරිසර පද්ධති වන්නේ කඩොලාන පද්ධති, මුහුදු තනකොළ, සහ කොරල් පරයි.

2016 වසරේදී තවත් විශ්වවිද්‍යාල ශිශ්‍ය පර්යේෂනයක් ලෙස, භූගෝලීය තොරතුරු තාක්ෂන (GIS) භාවිතාවෙන් පරිසර පද්ධති සහ කකුළු දැල් දමන තැන් අතර ඇති අතිච්ඡාදනය හැදෑරීමට පටන් ගන්නා ලදී.

පරිසර පද්ධති සහ ධීවර පිටියන් පිලිබඳ තොරතුර විවිද මූලාශ්‍ර (විද්‍යාත්මක පත්‍ර, ගෝලීය සිතියම්, සහ ධීවර ප්‍රජාව ඔස්සෙන්) වලින් ලබාගන්නා ලදී.

පෝක් සමුද්‍ර සන්ධියේ ධීවර පිටියන් සහ කඩොලාන පද්ධති අතර <0.1% අතිච්ඡාදනයක්, මුහුදු තණකොල සමග 11.4%ක අතිච්ඡාදනයක්, සහ කොරල් පර සමග 7.67% අතිච්ඡාදනයක් පෙන්වන ලදී.

මන්නාරම් ද්‍රෝනිය සඳහ මෙම අගයන් වූයේ <1% (කඩොලාන), 16.7% (මුහුදු තණකොල), 5.5% (කොරල් පර).

මෙම අගයන් සියල්ල සීෆුඩ් වොච් වැඩසටහන මගින් නිර්දේශ කරන අතිච්ඡාදන මට්ටමට (<50%) වඩා අඩු විය. එම නිසාවෙන් ශ්‍රී ලංකාවෙ නිල් පිහිනුම් කකුළු ධීවර කර්මාන්තය පරිසර පද්ධති වලට අවම වශයෙන් බලපෑම් කරන බවට පැවසිය හැකියි.

.

## නිල් පිහිනුම් කකුලු ධීවර කර්මාන්තය සංවර්ධන ව්‍යාපෘතිය සඳහ මූල්‍යමය සහය (2013-2018)

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | Total |
|---|---|---|---|---|---|---|---|
| සෘජු ආයෝජනය | $13,000 | $105,000 | $112,500 | $83,000 | $86,000 | $49,000 | $448,500 |

ශ්‍රී ලංකා නිල් පිහිනුම් කකුළු සංවර්ධන ව්‍යාපෘතියට දැනට ඇමරිකානු ඩොලර් 450,000 ආයෝජන වී ඇත. මෙම ආයෝජනයෙන් බහුතරයක් (48%) ලැබුනේ ජාතික ධීවර කර්මාන්ත ආයතනයේ කකුළුවන් පිලිබඳ කවුන්සිලියෙනි. ටැප්‍රොබේන් සීෆුඩ් ආයතනය (3%) සහ විකන් ඔෆ් ද සී ආයතනයන් (4%) දෙකම මෙම ආයෝජනයට සහය වී ඇත.

එක්සත් ජාතීන් සම්මේලනයේ ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් මෙම ආයෝජනයෙන් 25% දෙන ලදී. ඕස්ට්‍රේලියානු රජයේ සහන සහ වෙළඳාම් පිලිබඳ දෙපාර්තමේන්තුවෙන් ලැබුනු ආධාර වලින් පෝක් සමුද්‍ර සංධියේ ධීවර කර්මාන්තය දියුණු කරන ලදී.

මෙයට අමතරව පහත සඳහන් ආයන්තන සහ සංවිධාන වලින් මෙම ව්‍යාපෘතියට සහය දෙන ලදී.

1. සංක්‍රමිකයන් පිළිබඳ අන්තර්ජාතික සංවිධානය (6%)

2. සැන්ටා මොනිකා සීෆුඩ් ආයන්තනයේ ෆිෂ්වයිස් වැඩසටහන හරහා (4%)

3. බෙංගාලු බොක්කේ සාගර පරිසර පද්ධති වැඩසටහන හරහා (4%)

4. ආසියානු පදනම (3%)

5. සිලෝන් ෆ්‍රෙෂ් (<1%)

ඉහත සඳහ සෘජු ආයෝජනයට අමතරව, එයට සමාන අගයක් නොසෘජුව මෙම ව්‍යාපෘතියට (වැටුප්, තාක්ෂනික සහය, ගමන්, රැස්වීම්) ආයෝජනය වී ඇත. මෙය සඳහ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යංශයෙන්, ටැප්‍රොබේන් සීෆුඩ් ආයතනයේ, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ, සාගර විශ්වවිද්‍යාලයේ, කොළඹ විශ්වවිද්‍යාලයේ සහ පෙලාජිකොස් ආයතනයේ සිසුන්ට සහ සේවකයන්ට වියදම් වන ලදී.

2017 වසරේදී මොන්ටරේ බේ ආයතනය විසින් මෙම ධීවර කර්මාන්තය නොමිලේ විගණන ඇගයීමකට පත් කරන ලදී.

ශ්‍රී ලංකා මුහුදු ආහාර අපනයන සංගමය, ධීවර ජනතාව, සහ ශ්‍රී ලංකා රජය මෙම ව්‍යාපෘතියට නන් අයුරින් සහය දුන් සියලු දෙනාට ඔවුන්ගේ ස්තූතිය පල කරයි. මෙම ධීවර කර්මාන්තයට 'හොඳ විකල්ප' මුහුදු ආහර නිපදවන කර්මාන්තයක් ලෙසට නිර්දෙශ වීම සඳහ ඔබ දුන් සහයට අපගේ ස්තූතිය.

## 'හොඳ විකල්පයක්' සිට 'හොඳම තේරීමකට' 2021 වර්ෂය වෙද්දි ලඟා වීම

මෙම වසරේ සිට මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ 2021 වන විට දැනට ලැබී ඇති කහ පැහැති ඇගයුම, කොළ පැහැති ඇගයුමකට රැගෙන යාමයි. මෙය කිරීම සඳහ...

පළමු සම්මතය - දැනට පවතිනා කකුළු තොගයේ තත්වයේ මෙලෙසම පවත්වාගෙන යාම

දෙවන සම්මතය - කකුළු දැල් වලට හසු වෙන අනිකුත් සත්ව විශේෂයන් පිලිබඳ තවත් තොරතුරු එකතු කරගැනීම

තෙවන සම්මතය - ධීවර කළමනකරණ ප්‍රදේශ හඳුන්වාදීම, ආනයන රෙගුලාසි හඳුවාදීම, සහ ගැසට් පත්‍රය නීතිගත කිරීම

සිව්වන සම්මතය - කකුළු ධීවර පිටි සහ පරිසර පද්ධති අතර අතිච්ඡාදනය ස්ථිර කරගැනීම

සිදුකල යුතුය.

*මෙම පුවත් හසුන සහ ඊට පෙර පැමිණි පුවත් හසුන් 9ම සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවලින් ලබාගත හැක. මෙය සහ තවත් තොරතුරු සඳහ steve@pelagikos.lk වෙතට ඊ-මේල් ලිපියක් යොමු කරන්න.*